# 1. ශ්‍රී ලංකාවේ සති පාසල

දරුවන්ට සතිය ඉගැන්වීම, ඒ පිළිබඳ මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම, ඒ පුහුණුව හරහා පුද්ගලික, සාමාජික, සහ පාරිසරික වශයෙන් ගුණ නැණ දියුණු කරමින් දරුවන් සතිමත් බවේ සිට අවදිමත් (අප්‍රමාදය) බව දක්වා යන ජීවන ගමනකට මං පෙත සැලැස්වීම ලංකාවේ සති පාසලේ පූර්ණ වූ දැක්මයි.

"සතිය" ගැන මූලික පුහුණුව, උපදේශනය, වැඩමුළු සහ පාඨමාලා ඔස්සේ, සතිමත් පිරිසක් එකතුව, සමාජ ආයතන සමග සහයෝගයෙන්, සතිමත් ගුරුවරුන් බිහි කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන වෘත්තීමය පුහුණුව ලබා දීම තුළින් ඉගනුම් ක්‍රියාවලියක් (ගුරු/ශිෂ්‍ය) දියත් කිරීම සති පාසලේ මෙහෙයුමයි.

ඉහත සඳහන් දැක්ම සහ මෙහෙයුම මත "සතිය" හඳුන්වා දී පුහුණු කිරීම සඳහා ජාති, ආගම්, වර්ණ, කුල යන කිසිම බේදයකින් තොරව ලංකාවේ ළමයින්ගේ යහජීවනය සඳහා ළමා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස "සති පාසල" වර්ෂ 2016 දී බිම් මට්ටමෙන් පටන් ගත්තා.

වර්ෂ 2017 දී සති පාසලට විධිමත් සහ නීතිමය තත්වයක් ලබා දී එහි ගිණුම් සහ පරිපාලන කළමනාකරණය විධිමත්ව කිරීම සඳහා "සති පාසල පදනම" ලියා පදිංචි කිරීම සති පාසලේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් වුනා.

සති පාසලේ විෂය මාලාව කේන්ද්‍ර ගත වන්නේ, තනි තනි ශිෂ්‍යයින්ගේ සැබෑ හැකියා වන්, දක්ෂ කම් තව තවත් වර්ධනය කර ගැනීම, ගුණ ධර්ම හොඳින් අවබෝධ කර ගැනීම ,ජනිත වන සිහි නුවණ තුලින් සාක්ෂාත් වන සාරධර්ම හරහා ජාතිය ගොඩනැගීමේ කර්තව්‍යයට සාධනීය දායකත්වයක් සැපයිය හැකි වටිනා කොටස්කරුවන් බවට දරුවන් පත් කිරීමටයි.

"සතිය පුහුණු කිරීම" කුඩා දරුවන්ට, යොවුන් වයසේ අයට මෙන්ම, ඔවුන්ට මාර්ගෝපදේශකත්වය දෙන දෙමව්පියන්, ගුරුවරුන් හා උපදේශකයන්ටත් එක සේ වැදගත් වන බව සති පාසල පෙන්වා දෙනවා.

ඒ වගේම, යොවුන් විය සහ මනස සංවර්ධනය පිළිබඳ පර්යේෂණ කරන ලෝකයේ විශේෂඥයන්ගේ විශේෂ අවධානය ද "සති පුහුණුව" කෙරෙහි යොමු වී ඇති කාරණයක්.

සති පාසල නිර්මාතෘ පූජ්‍ය ධම්මජීව ස්වාමීන් වහන්සේ "සතිය" කියන්නේ කුමක් ද යන්න ගැන සරලව නමුත් ප්‍රශස්ත වශයෙන් ඒ ගැන කියා දෙන්න ක්‍රම වේදය පාදක කර ගන්නේ බුදු පියාණන් වහන්සේ දේශනා කල විශ්ව ධර්මයේ සිත පිරිසිදු කර ගැනීම සඳහා එකම මග ලෙස කියා දුන් "සතර සතිපට්ඨානයයි". ඒ අනුව සති පාසලේ ප්‍රධාන ඉගෙනුම්/ඉගැන්වීම් පහත සඳහන් **"දස නියාමන කරුණු"** මත පදනම් වෙනවා.

1. සති පට්ඨාන සූත්‍රය අනුව සතිය සත්වයාගේ විශුද්ධියට ඒකායන මාර්ගය වේ.

2. හඳුන්වා දෙන්නේ ආධුනිකයකුගේ සතියයි. සත්තිස් බෝධි පාක්ෂික ධර්ම අනුව සතිය අට ආකාරයක් ගනී. එහි ඇරඹුම කායනුපස්සනාවයි. කය කෙරෙහි/ඉරියව්ව කෙරෙහි සතිමත් වීමයි. සති පාසල අවධාරණය කරන්නේ මෙයයි.

3. මෙය වැළැක්වීමේ (නිවාරණය)පිළිවෙතක් මිස නූතන බහුල භාවිතයේ පරිදි රෝග සුව කිරීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ක්‍රමයක් නොවේ. "වෙද කමට වඩා හෙද කම හොඳයි".

4. සතිය සහ අප්පමාදය ඉතා සමීපව සම්බන්ධයි. අප්පමාදය සතිය මෙන්ම දියුණුවට සහ අභිවුර්ධියට පදනම වේ.

5. සති මාත්‍රය යන්න සෑම මනුෂ්‍යයකුට පොදු ලක්ෂණයකි. එය බුදු දහමට හෝ බෞද්ධයන්ට සීමා වූවක් නොවේ.

6. මේ සඳහා බාහිරයෙන් කිසිදු දෙයක් අවශ්‍ය නැත. සියලු මනුෂ්‍යයන්ට කැපය.

7. කිසිම බාහිර අධිකාරියක අවසරයක් පැතීම අවශ්‍ය නැත.

8. ඔබගේ ජන්ම දායාදයකි .අවශ්‍ය වන්නේ එයට නිසි ප්‍රමුකත්වය ලබා දීම පමණකි.

9. ගැටුම් අවම නිරවුල් මාර්ගය ස්වාභාවික, කාලයත් සමග හෙළි කරයි.

10. බාධා අවම බල කිරීමකින් තොර ආකාරයටම ඉදිරියටම යවයි.(අවිරුද්ධ ප්‍රතිපදා

## 2. සතිය නිර්වචනය- "සතිය" යනු;

සති පාසල නිර්මාතෘ පූජ්‍ය උඩ ඊරියගම ධම්මජීව ස්වාමීන් වහන්සේගේ වචනයෙන්;

- "මේ මොහොතට එළඹ වාසය කිරීම, තමන් ඉන්න ඉරියව්වට එළඹ වාසය කිරීම, මම දැන් මෙතන යන්නට අවදි වීම, හිතට එන දේ පමා නොවී දැක ගැනීම, අප්‍රමාදය"

- යෙදෙන කාර්යයට සිත යොමුකර වර්තමාන මොහොතට එළඹ සිටීමෙන් හා තීන්දු තීරණ වලින් තොරව ඒ ඒ මොහොතේ සිහිය පැවැත්වීමේ අත්දැකීම් තුලින් මතුවෙන දැනුවත් වීමයි.

- සතිය යන්නෙහි තේරුම හුදෙක්ම, හැමදාම අප කරන දේ සහ කියන දේ ගැන හැකිතාක් දුරට සම්පූර්ණයෙන්ම සතිමත් වී සිටීමයි. අප එදිනෙදා කරන කියන දේ ගැන හොඳින් සැලකිලිමත් ව සිටීමත් ඉන් අදහස් වෙයි.